ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය - 2019
---------------------------------------------

**1.1 මතය**

-----

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** විගණන විෂය පථය

--------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** මූල්‍ය ප්‍රකාශන

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 16 හි 36 ඡේදය ප්‍රකාරව වත්කම්, පන්තියක් ලෙස එකවර ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් මණ්ඩලයේ ආයෝජන හා ආයෝජන නොවන රු1,356,028,570 ක් වූ ඉඩම් වැඩි දියුණු කිරීම් හා ගොඩනැගිලි වලින් රු1,206,510,768 ක් වූ කොටසක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. | ප්‍රමිතයට අනුව 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන බව. | ප්‍රත්‍යාගණනයේදී අදාළ වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 16 හි 52 ඡේදය ප්‍රකාරව වත්කමක ක්ෂය අනුපාතය අනුව අදාළ කාලසීමාව අවසානයේදී මුළුමනින්ම ක්ෂය වී අවසන් විය යුතු වුවත්, 2004 සිට 2008 දක්වා මිලදීගත් පිරිවැය රු. 5,035,965 ක් වූ වත්කම් වල ශුද්ධ අගය රු 1,018,290 ක් ලෙස ගිණුම් වල දක්වා තිබුණි. | සමුච්චිත අගයන්ද ඇතුළුව අවශ්‍ය නිවැරදි කිරීමේ සටහන් 2020 වර්ෂය සඳහා කඩිනමින් ගිණුම්ගත කර ප්‍රමිතයට අනුකූල වන ලෙස මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන බව. | වත්කමක අවශේෂ වටිනාකම එහි ධාරණ අගය නොඉක්මවිය යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුලදී වත්කම් වර්ගීකරණය කිරීමේදී ඇති වූ දෝෂ ඉවත් කිරීම සඳහා නිවැරදි වත්කම් ගිණුම්වලට මාරුකිරීම් කර තිබුණි. එහිදී පිරිවැය රු **4,241,896** ක් වූ යන්ත්‍රෝපකරණවල ශුද්ධ අගය රු **2,094,150** ක් වුවත් රු **852,004** ලෙසද, පිරිවැය රු **.875,500** ක් වූ ලීබඩු උපකරණ වල ශුද්ධ අගය රු. **858,632** ක් වුවද රු. **437,750** ක් ලෙස කාර්යාල උපකරණ වල දක්වා තිබුණි. ඒ අනුව රු**1,663,028** කින් කාර්යාල උපකරණ ගිණුමේ ශුද්ධ අගය අඩුවෙන් දක්වා තිබුණි. | විස්තරාත්මක උපලේඛනයක් නොලැබුණ නිසාත් එක් එක් වත්කමේ තක්සේරු අගයන් වෙන් වෙන් වශයෙන් නොදන්නා නිසාත් අදාළ මාරු කිරීම් වලින් පසු ඉදිරිපත් කිරීමේ ව්‍යාකූලතා පැන නැගුණු බව හා **2020** මූල්‍ය ප්‍රකාශ මගින් මෙය නිවැරදි කරන බව. | වත්කම් ලේඛනය යාවත්කාලීන කල යුතුය. |
| (ආ) | **2014** දෙසැම්බර් **31** දිනට වටිනාකම රු. **91,500,000** කට ප්‍රත්‍යාගණනය කර තිබූ කාර්මික ජනපද ඉඩම සඳහා රු.**4,575,000** ක වාර්ෂික ක්ෂය වීම් ගණනය කර තිබුණි. ඉඩම් සඳහා ක්ෂයවීම් සිදු නොකරන බැවින් එම සටහන මේ දක්වා ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි. | **2020** මූල්‍ය ප්‍රකාශ මගින් මෙය නිවැරදි කරන බව. | ඉඩම් සඳහා ක්ෂයවීම් නොකල යුතුය. |
| (ඇ) | කාර්මික ජනපදයේ අභ්‍යන්තර මාර්ග කානු හා වැට ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව සඳහා ඉංජිනේරු අංශය විසින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සහතික කල වැඩ වටිනාකම රු. **16,077,084** ක් වුවත් කෙරීගෙන යන වැඩ ලෙස රු.**16,591,875** ක් ගිණුම්ගත වී තිබුණි. මේ අනුව රු. **514,791** කින් කෙරීගෙන යන වැඩ ගිණුම වැඩියෙන් දක්වා තිබුණි. | කොන්ත්‍රාත්කරුගේ අවසන් බිල්පත අනුව “ කළ වැඩ “ සඳහා ලබාදෙන වටිනාකම ගිණුම්ගත කිරීම උචිත ගිණුම්කරණ ප්‍රතිකර්මය වන බව | සහතික කල වැඩ වටිනාකමට ගිණුම් පවත්වාගත යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට අබලි ද්‍රව්‍ය හා අනෙකුත් මිලදීගැනීම් සඳහා ගෙවන ලද රු.30,891,311 ක් වූ පෙරගෙවුම් අත්තිකාරම් මුදලින් 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ රු.13,050,627 ක මුදල් අයකරගැනීමට නොහැකිවී තිබුණි. මෙම මුදලින් රු.11,676.251 ක් සඳහා වෙන් කිරීමක් ද සිදු කර තිබුණි. | ශේෂ නිරවුල් කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින බව | ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට හෝ නිරවුල් කරගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2009 හා 2017 කාල පර්ච්ඡේදයට අදාල රු.12,495,681 ක් වූ කාර්මික ජනපද වලින් අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ශේෂ කඩිනමින් පියවන ලෙසට හා නැතිනම් ගිවිසුම් ප්‍රකාර කටයුතු කරන බවට දන්වා ඇති බව | අයවිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(11) ඡේදය | අදාල අමාත්‍යාංශ ලේකම්ගේ පුද්ගලික අනුමැතිය ලබානොගෙන වයස අවුරුදු 60 ඉක්මවූ නිලධාරිනියක මණ්ඩලයේ මානව සම්පත් අධ්‍යක්ෂ ධූරයට බඳවාගෙන 2016 මැයි මස සිට 2019 පෙබරවාරි දක්වා රු. 2,989,008 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි | මෙම පත් කිරීම සම්බන්ධයෙන් 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභා පනත යටතේ විමර්ශණයක් තවදුරටත් සිදුවෙමින් පවතින හෙයින් එම නිලධාරිනියගේ පත්කිරීම හා ඒ වෙනුවෙන් ගෙවා ඇති දීමනා සම්බන්ධයෙන් මණ්ඩලයට ගැනීමට සිදුවන ක්‍රියාමාර්ගය ඉදිරියේදි දැනුම් දෙන බව. | චක්‍රලේඛය ප්‍රකාරව වයස අවුරුදු 60 ඉක්ම වූ නිලධාරිනියකගේ සේවාව ලබාගැනීමේදී ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | **2013 වර්ෂයේ අනුමත කල මණ්ඩලයේ බඳවාගැනීමේ පරිපාටිය** | **අනුමත බඳවාගැනීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරියකු අලෙවි අධ්‍යක්ෂ තනතුරට බඳවාගෙන 2015 ජුනි 26 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා රු.7,206,363 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.** | **මෙම නිලධාරියා බඳවාගත් අවස්ථාවේ මූලික සුදුසුකම් සපුරා නොමැති හෙයින් ඔහුගේ පරිවාස කාලය අවසන් වුවද සේවය ස්ථිර කිරීම අත්හිටුවා වැටුප් වර්ධක ලබාදීම නවතා ඇති බව.** | **අනුමත බඳවාගැනීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් සේවයට බඳවා ගතයුතුය.** |
| (ඇ) | **2013 වර්ෂයේ අනුමත කල මණ්ඩලයේ බඳවාගැනීමේ පරිපාටිය** | **අනුමත බඳවාගැනීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරියකු ව්‍යවසාය සංවර්ධන අධ්‍යක්ෂ තනතුරට බඳවාගෙන 2013 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා රු.9,221,341 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි** | **මෙම නිලධාරියා තනතුරට අදාළ සුදුසුකම් සපුරා නොතිබීම හේතුවෙන් පත්වීම ස්ථිර කල නොහැකි වී ඇති අතර 2016 වසරේ සිට වාර්ෂික වැටුප් වර්ධක ලබාදී නොමැති බව** | **අනුමත බඳවාගැනීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් සේවයට බඳවා ගතයුතුය.** |

**2.** **මූල්‍ය සමාලෝචනය**
**----------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**
**--------------**

**සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.7,828,307 ඌණතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,464,789 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11.293,096 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විකුණුම් ආදායම අඩුවීම හා පරිපාලන වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.**

**2.2** **ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**
**------------------------------------------------------------**

| | 2019 | 2018 |
|---|---|---|
| | රු. | රු. |
| අබලි යකඩ ආදායම | 241,855,519 | 325,738,660 |
| අනෙකුත් ආදායම් | 141,692,121 | 139,761,899 |
| මුළු ආදායම | 383,577,640 | 465,560,559 |
| පරිපාලන වියදම | 583,118,229 | 550,531,946 |

**පෙර වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ මුළු ආදායම සියයට 18 කින් අඩුවී තිබුණි. රු. 383,577,640 ක් වූ මුළු ආදායමෙන් සියයට 63 ක් එනම් රු. 241,855,519 ක් අබලි යකඩ විකිනීමෙන් ලද ආදායම වන අතර මණ්ඩලයේ ප්‍රධාන අරමුණ හා කාර්යභාරය ඉටුකරගැනීමට අදාල කාර්යයන් වෙනුවෙන් දායකත්වය සියයට 37 ක් එනම් රු. 141,692,121 ක අඩු මට්ටමක පැවතුණි.**

## 2.3 අනුපාත විශ්ලේෂණය

|  | 2019 | 2018 |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 1: 1.3 | 1 : 1.5 |
| දළ ලාභ අනුපාතය | 31 | 30.5 |
| ශුද්ධ ලාභ අනුපාතය | (2) | 0.7 |

දළලාභ අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව නොවෙනස්ව පැවතුනද ශුද්ධ ලාභ අනුපාතය සියයට 2 ක සෘණ අගයක් වීමට රු.32,786,283 කින් පරිපාලන වියදම වැඩිවීම හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

|  | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවේ කර්මාන්තවල ක්‍රියාවලින් යාන්ත්‍රික කිරීම, ඵලදායිතාවය ඉහල නැංවීම, තත්ත්වය උසස් කිරීම, මානව අත්වැරදීම් අවම කිරීම, කාර්මික අවශ්‍යතාවලට සවියක් වීම ආදිය අරමුණු කරගෙන රොබෝ තාක්ෂණය හදුන්වාදීම සදහා අමප16/1424/723/039 හා 2016 අගෝස්තු 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබ මණ්ඩලයේ ගොඩනැගිල්ලක මෙම මධ්‍යස්ථානය ආරම්භකර තිබුණි. රුපියල් මිලියන 40 වටිනාකම් ඇති රොබෝ යන්ත්‍ර 04 ක් 2017 අප්‍රේල් මස සවිකිරීම ඇතුළත්ව එතැන් සිට 2019 දෙසැම්බර් 31 දක්වා රුපියල් 133,033,293 ක් වැය කර තිබුණි. නමුත් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2018 දෙසැම්බර් වන විට සමාගමක් වශයෙන් ලියාපදිංචි කිරීම කර නොතිබුණු අතර අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම කර නොතිබුණි. මෙම ව්‍යාපාරයේ අසාර්ථකත්වය මත 2018 දෙසැම්බර් 28 දිනැති 2013 /14 දරන ගැසට් පත්‍රය මගින් මෙය විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. | මෙම ව්‍යාපෘතිය වෙනත් ආයතනයකට ලබා නොදුන්නේ නම් කාර්මික සංවර්ධන මණ්ඩලයේ පූර්ණ දායකත්වයෙන් අපේක්ෂිත අරමුණු කරා ගෙනයාමට ඉඩ තිබුණ බව. | ව්‍යාපෘතිය වෙනත් අමාත්‍යාංශයකට පවරා ඇති බැවින් නිර්දෙශයක් ලබාදිය නොහැක. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රොබෝ තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදන මත රු.35,913,582කට මිලදී ගෙන තිබූ සීඑන්සී මිල් යන්ත්‍රය හා ලේත් යන්ත්‍රය මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ලෙන් බැහැරව නිසි පවරාගැනීමකින් තොරව ඉංජිනේරු අංශයේ ගොඩනැගිල්ලක ස්ථාපිත කර මණ්ඩලයේ ඉපැයීම් සඳහා උපයෝගී කර ගෙන තිබුණි. එහි අයිතිය විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට පවරා දීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් භෞතිකව ඉවත් කරගන්නා තෙක් ආර්ථිකමය ඉපයීම් සඳහා යොදා ගැනීමෙන් එකී වත්කම් නිශ්කාර්යවීම/අකර්මන්‍ය වීම වැලකී යනු බව. | අයිතිය පවරාගෙන වත්කම් ලේඛණයට ඇතුලත් කලයුතුය. |
| (ඇ) | මණ්ඩලය ස්ථාපිත කර ඇති හෙක්ටයාර් 1.2953 ක පමණ ඉඩම හා ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා ඇති අක්කර 25 රූඩ් 9 පර්චස් 186.5 ක ප්‍රමාණයක ඉඩම්වල අයිතිය මණ්ඩලය සතු කර ගැනීමට නොහැකි වී ඇත . මෙම දේපළ සඳහා විශාල වාණිජ වටිනාකමක් ඇතත් වටිනාකම් ගණනය කර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට මේ දක්වා නොහැකිවී තිබුණි. ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර ඇති භූමියෙහි නව බිම ගොඩනැගිල්ල පිහිටි ඉඩමෙන් 3/4 ක ප්‍රමාණයක පෞද්ගලික ව්‍යාපාර පවත්වාගෙන යැම හා ඔවුන්ගෙන් කිසිදු බිම් කුලියක් හෝ ගොඩනැගිලි කුලියක් අයකර ගැනීමට මණ්ඩලයට නොහැකි වී ඇති අතර ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය පවරාගැනීමටද මේ දක්වා අපොහොසත් වී තිබුණි. | නෛතික හිමිකමක් නොමැති හෙයින් ප්‍රධාන කාර්යාලයට යාබද නවබිම පරිශ්‍රයෙහි ක්‍රියාත්මක වෙමින් පවතින පෞද්ගලික ව්‍යාපාර වලින් කුලී අය කිරීමක් සිදු කළ නොහැකි බව හා දේපළ පවරා ගැනිමට අදාළ කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතින බව. | ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය පවරාගෙන මණ්ඩලයේ ඵලදායී කටයුතු සඳහා යොදා ගතයුතුය. |
| (ඈ) | මණ්ඩලයට අයත් ජනපද 18 හි මුළු බිම් කොටස් 726 ක් පවතින අතර 2019 දෙසැම්බර් 31 දින වන විට බිම් කොටස් 72 ක් කර්මාන්තකරුවන් හට බෙදා දී නොතිබුණි. මෙම බිම් කොටස් වර්ෂ කිහිපයක සිට හිස්ව පැවතුණි. ජනපද 05 කට අදාළව කර්මාන්තකරුවන් හට පවරන ලද බිම් කොටස් 98 කින් බිම් කොටස් 28 ක් පදිංචිය සඳහා භාවිතා කර තිබුණි. | සුදුසුකම් සපුරන කර්මාන්ත ස්ථානගත කරනතෙක් එම කර්මාන්ත සඳහා බිම් කොටස් ලබාදීමේ අපේක්ෂාවෙන් කාර්මික ජනපදවල හිස් බිම් කොටස් පවත්වා ගනු ලබන බව. | අත්පත් කර ගත් ඉඩම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ජනපද 7 ක බිම් කොටස් 30 ක් 2008 සහ 2015 වර්ෂවල සිට වසා දමා ඇති අතර එම බිම් කොටස් 2019 දෙසැම්බර් 31 දින වන විටද වෙනත් කර්මාන්තකරුවන් වෙත බෙදා දීමට කටයුතු කර නොතිබුණි. | නේවාසිකයින් නැවත කර්මාන්තගත කිරීමට හෝ නේවාසික භාවිතයෙන් බැහැර කිරීමට කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින බව. | කර්මාන්තකරුවන් වෙත බෙදා දීමට කටයුතු කලයුතුය. |
| (ඊ) | මණ්ඩලයට අයත් ජනපද 18 අතුරෙන් ජනපද 9 ක 2019 වර්ෂයේ රු.5,608,802 ක් වූ අලාභයක් ලබා තිබූ අතර බූස්ස, බෙලිඅත්ත, බද්දේගම හා කරන්දේනිය යන ජනපදවල වියදම පමණක් රු.869,335 ක් වූ අතර කිසිදු ආදායමක් උපයා නොතිබුණි | කාර්මික ජනපද ආරම්භ කිරීම මූලික අරමුණ වන බව හා ජනපද වෙනුවෙන් කරනු ලබන ආයෝජනය මත ලැබෙන ප්‍රතිලාභය පිළිබඳව අවධානය යොමු නොකරන ලද බවත්<br>පොත්වල වාර්තාවී ඇති ක්ෂයවීම් වියදම් පිළිබඳව කරුණු සොයා බලා ගිණුම් නිවැරදි කිරීමට සටහන් කරගෙන ඇති බව | අලාභ ලබන ජනපද ලාභ ලබන තත්ත්වයට පත්කිරීමට කටයුතු කලයුතුය. |
| (උ) | අබලි ලෝහ කළමනාකරණය පිළිබඳ 2013 සකස්කළ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව අබලි ලෝහ කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් වෙත සාධාරණ පදනමක් යටතේ බෙදා හැරීම සිදුකර නොතිබුණි. ඒ අනුව 2019 වර්ෂයේදී මණ්ඩලය විසින් රු.79,306,352 කට කර්මාන්තකරුවන්ට අබලි ට්‍රාන්ස්ෆෝමර් විකුණා තිබූ අතර, මෙයින් සියයට 22 ක් එක් කර්මාන්කරුවෙකුට ද ඇතුළුව කර්මාන්තකරුවන් තිදෙනෙකුට සියයට 54.6 ක් එනම් රු.43,262,400 ක්ද ඉතිරි සියයට 45.4 එනම් රු.36,043,952ක් කර්මාන්තකරුවන් 8 දෙනෙකුට ද ලබා දී තිබුණි. | මෙම ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂය සඳහා රු.70,069,800 ක අබලි ට්‍රාන්ස්පෝමර් 568 ක් කර්මාන්තකරුවන් 09දෙනෙකු අතර අලෙවි කර ඇති බව. | මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව අබලි ලෝහ කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් වෙත සාධාරණ පදනමක් යටතේ බෙදා හැරීම සිදුකලයුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදනවල තත්ත්වය වැඩිදියුණු කිරීම, නාස්තිය අවම කිරීම, නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම හා නිෂ්පාදන පිරිවැය අඩු කිරීම අරමුණු කරගෙන රබර් ඉන්ජෙක්ෂන් | කර්මාන්තකරුවන්ගේ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කැමැත්ත මත පදනම් වූ ඉල්ලුම අනුව මෙම යන්ත්‍රය භාවිතා කර ඇති බව හා ඇණවුම ලබාගැනීමට සාකච්ඡා කරමින් පවතින බව. | යන්ත්‍රය උපරිම ලෙස භාවිතා කිරීමට කටයුතු කලයුතුය. |

| | | |
|---|---|---|
| මෝල්ඩින් යන්ත්‍රයක් 2016 වර්සයේදී රු.9,318,026 කට මිලදී ගෙන තිබුණි. මිලදී ගත් 2016 වර්ෂයේ සිට 2019 දෙසැම්බර් 31 දක්වා පුහුණුවීම් කර්මාන්තකරුවන් 39 දෙනෙකු සඳහාත් , තාක්ෂණ උපදෙස් ලබාදීම 266 දෙනෙකු සඳහා පමණක් සිදුකර තිබුණි. ආයතන කිහිපයක් වෙත සාම්පල් ලබා දී තිබුණද ඇණවුම් කිසිවක් ලැබී නොතිබුණි. ඒ අනුව යන්ත්‍රය උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා කිරීමට නොහැකි වී තිබුණි. | | |

**3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශ අරමුදල් යටතේ ලද ප්‍රදාන මඟින් ක්‍රියාත්මක කර ඇති ඇස්තමේන්තගත වටිනාකම රු.78,876,959 ක් වූ කොන්ත්‍රාත් 04 ක්, රාජ්‍ය ආයතන 03 ක් හා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත ලබාදී තිබුණි. නමුත් එම ආයතන විසින් නියමිත පරිදි වැඩ අවසන් නොකොට අතරමග නවතා දමා තිබුණි | ඉදකිරිමේ කටයුතු ප්‍රමාද වූ බව. | කොන්ත්‍රාත් ආයතන සමඟ සාකච්ජා කොට ඉදිකිරීම් කටයුතු අවසන් කරවාගැනීමට කටයුතු කලයුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු 38,139,000 ක ඇස්තමේන්තුගත මුදලකට 2017 දෙසැම්බර් 13 පැවති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව ටෙන්ඩර් කැඳවීමට කාලයක් නොමැති බැවින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ඉටුකර ගැනීමට තීරණය කර තිබුණි. ලබාදී තිබූ ඇස්තමේන්තුවෙන් රු 11,656,000 ක (වැටබදු හා අවිනිශ්චිත වියදම් හැර) වටිනාකමකට බිම්මහල පමණක් ඉදිකිරීමට නිර්දේශ ලබාදී තිබුණි. ඒ අනුව 2017 දෙසැම්බර් 19දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට කොන්ත්‍රාත්තුව භාරදී තිබුණද | ඉදිකිරිමේ විෂය වෙනස්විම නිසා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කළ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ උප කොන්න්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු වලින් ඉවත් වී ඇත. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මණ්ඩලය හා එක්ව බිම් මහලේ ඉතිරි වැඩ කොටස් අවසන් කිරීමේ තීරණයකට එළඹ ඇති බව. | කොන්ත්‍රාත් ආයතන සමඟ සාකච්ජා කොට ඉදිකිරීම් කටයුතු අවසන් කරවාගැනීමට කටයුතු කලයුතු බව හා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර ප්‍රතිපාදන ඇති බවට සහ අවශ්‍යතාව අනුව සැලසුම් සකස් කලයුතුය. |

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික නොකොන්ත්‍රාත් ආයතනයක් වෙත රු 26,379,710 ක වැට් රහිත මුදලකට කොන්ත්‍රාත්තුව භාරදීම 2019 ජනවාරි 21දක්වා ප්‍රමාදවී තිබුණි. ගොඩනැගිල්ලේ ව්‍යුහය වෙනස් කිරීමට මණ්ඩලයේ කළමණාකාරීත්වය ගත් තීරණය හේතුවෙන් අත්තිකාරම් වශයෙන් රු.2,914,000 ක් හා රු.2,964,640 ක් බිල්පත් මඟින් ගෙවීම් සිදුකළ ද ටෙන්ඩරය පවරා වසර 2 ½ ක ගතවී ඇතත් මේ දක්වා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා යෝග්‍ය අත්තිවාරමක් පමණක් ඉදි කර තිබුණි. එසේම මණ්ඩලය සතුව ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති අවස්ථාවක ටෙන්ඩර් කැඳවීමකින් තොරව රජයේ ආයතනයකට වුවද ඉතා ඉහළ මිල ගණන් යටතේ කොන්ත්‍රාත්තුව පවරා තිබුණ අතර ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක්ද අත්සන් කර නොතිබුණි.

**3.5** මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මණ්ඩලයේ බඳවාගැනීම් පරිපාටිය අනුව ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරි තනතුර කණිෂ්ඨ කළමණාකාර මට්ටමේ තනතුරක් වන නමුත් ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR64/2009 දරන නඩු තීන්දුව පදනම් කරගෙන නිලධාරීන් 55 දෙනෙකු සඳහා ව්‍යාපාර ප්‍රවර්ධන කළමණාකාර වශයෙන් මධ්‍යම කළමණාකාර මට්ටම ලබාදී තිබුණි. ඒ අනුව පත්වීම් දිනය වූ 2016 ජුනි 23 දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා දළ වශයෙන් රු.මිලියන 117,895,454 ක මුදලක් දල වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. මෙම තනතුරු සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2020 ජුනි දක්වාම ලබාගෙන නොතිබුණි. | කණිෂ්ඨ හෝ මධ්‍යම කළමණාකරන මට්ටමෙ පිහිටුවන ලෙස නඩු තීන්දුවෙහි දැක්වෙන බව හා යෝජිත කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරන සැලැස්ම තුලින් මෙම ගැටළුව නිරාකරණය වන බව | තනතුරු ලබාදීමට පෙර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 714 වුවත් ව 2016වර්ෂයේ සිට 2019 දක්වා කාර්ය මණ්ඩලය 482 සිට 534 අතර වීම හේතුවෙන් අවශ්‍යා ප්‍රමාණයට කාර්ය මණ්ඩලය සංශෝධනය වී නොතිබුණි . | රජය මගින් අත්හිටුවා ඇති බඳවාගැනීම් චක්‍ර ලේඛය ඉවත්කලපසු බඳවාගැනීම් සිදුකරන බව. | අවශ්‍යතාවය අනුව කාර්ය මණ්ඩලය සංශෝධනය විය යුතුය. |
| (ඇ) | පරිපාලන හා සැලසුම් අධ්‍යක්ෂ තනතුරු දෙකෙහි පිළිවෙලින් 2012 සහ 2018 වර්ෂවල සිට පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | සම්මුඛ පරීක්ෂන පැවැත්වුවද බඳවාගැනීමට නොහැකිවූ බව හා රජය මගින් අත්හිටුවා ඇති බඳවාගැනීම් චක්‍ර ලේඛය ඉවත්කලපසු බඳවාගැනීම් සිදුකරන බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කලයුතුය. |
| (ඈ) | මණ්ඩලයේ ඉංජිනේරු අංශයේ තනතුරු 78 ක පමණ සේවක පුරප්පාඩු පැවතිය දී හා ඉංජිනේරු සේවාවන් නිසි පරිදි ක්‍රියාත්මක කර ගැනීමට නොහැකිව පවතින අවස්ථාවක අධ්‍යක්ෂ ඉංජිනේරුවරයා රාජ්‍ය සමාගමකට තාවකාලිකව 2019 අගෝස්තු මස සිට මුදාහැරීමට අවසර ලබාදී තිබුණි. | ලංකා මිනරල් සෑන්ඩ් සමාගම සඳහා අධ්‍යක්ෂ ඉංජිනේරුවරයාගේ සේවය තවදුරටත් එම සමාගම වෙත ලබාදීමට සිදුවී ඇති බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කලයුතු බව හා අධ්‍යක්ෂ ඉංජිනේරුවරයාගේ සේවාව පූර්ණකාලීනව ලබාගතයුතුය. |

## 3.6 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වාර්ෂික වාර්තාව අනුව පවතින නිෂ්පාදන කර්මාන්ත සංවර්ධනය කිරීම පිළිබඳ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබූ අතර එය 2019 සහ 2020 යන වර්ෂවල අදියර 2 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර ඇති බවත්, පළමු වර්ෂයේදී දිස්ත්‍රික් මට්ටමින් පවතින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් 500 දෙනෙකුට කර්මාන්ත මුහුණ දෙන ගැටළු විසඳා ගැනීම සඳහා සහය සපයා දෙමින් එම කර්මාන්ත සංවර්ධනය කිරීම බව දක්වා තිබුණි. නමුත් 2019 වර්ෂයේ මණ්ඩලය විසින් සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම තුළ මෙම ව්‍යාපෘතිය ඇතුළත් කර නොතිබුණි.<br>මුළු ආදායමෙන් සියයට 70 ක් පමණ වන අබලි ද්‍රව්‍ය මිලදී ගැනීමේ විකිණීමේ ව්‍යාපෘතිය ප්‍රධාන ආදායම් මාර්ගය වුවද, මෙම ව්‍යාපෘතිය 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන සියළු කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කලයුතුය. |